# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No. BD/GPS 121/9/23-(2018)
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2018.06.01

**ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2018**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින සියළුම සංවර්ධන ව්‍යාපෘතීන්හි තොරතුරු අන්තර්ගත කරමින් බහුකාර්ය දත්ත පද්ධතියක් (Multi-Purpose Database) ස්ථාපිත කිරීම</u>**

රජයේ බහුකාර්ය සංවර්ධන කාර්යයන් සඳහා භාවිතය පිණිස, සියලුම ව්‍යාපෘති වල අදාළ තොරතුරු අන්තර්ගත වන පරිදි ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්ද ඇතුළත්ව සවිස්තරාත්මක දත්ත පද්ධතියක් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් සකස් කෙරෙමින් පවතී.

02. බොහෝ රාජ්‍ය ආයතන මගින් විවිධ කාර්යයන් සඳහා භාවිතා කිරීම පිණිස පරිගණක පද්ධතීන් ගණනාවක් ස්ථාපිත කර ඇති බවත්, ඒවා මේ වනවිට ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් එකිනෙටක සම්බන්ධ කර ඇති බවත් නිරීක්ෂණය වේ. කෙසේ වුවද, රජයේ ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා පුළුල් පරිශීලනයට පහසු දත්ත පද්ධතියක් සකස් කිරීමට අවශ්‍ය වී ඇත. එසේම, වඩාත් සුදුසු ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා නිවැරදි හා යාවත්කාලීන තොරතුරුද අවශ්‍ය වේ. එමෙන්ම, රට තුළ හදිසි අවස්ථා ඇතිවීමේ වැඩි ප්‍රවණතාවයක්ද මේ වනවිට දැකගත හැකිවන අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් වහාම ගතයුතුව ඇත.

03. එමනිසා, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සියලුම රාජ්‍ය ආයතන සමග සාකච්ඡා කොට දත්ත පද්ධතියක් සකස් කෙරෙමින් පවතී. මෙම ක්‍රියාවලියේදී යෝජිත බහුකාර්ය දත්ත පද්ධතිය සකස් කිරීමේ කර්තව්‍යය සපුරාලීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමේ හැකියාව පවතී.

මෙහිදී, පහත සඳහන් තොරතුරු යෝජිත දත්ත පද්ධතිය සඳහා අදියර 3 කින් අන්තර්ගත කරනු ලැබේ.

(අ) සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් දැනටමත් ඇතුළත් කර ඇති සහ වෙනස් කළ නොහැකි **මූලික** තොරතුරු

(ආ) වාර්ෂිකව/මාස හයකට වරක් යාවත්කාලීන කළයුතු **සාමාන්‍ය** තොරතුරු

(ඇ) සතිපතා/මාසිකව යාවත්කාලීන කළයුතු **වත්මන්** තොරතුරු

04. මෙම කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම ක්‍රමානුකූලව අදාළ තොරතුරු ඇතුළත් කරනු ලැබීම සඳහා වෙබ් පිටුවක් මේ වනවිට සකස් කෙරෙමින් පවතී. මෙම වෙබ් පිටුව සකස් කෙරෙනතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් සහ යෝජිත/අනාගත සංවර්ධන ව්‍යාපෘතීන්, ප්‍රමුඛතා පදනම මත, හඳුනා ගන්නා ලෙසට සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා සිටිනු ලැබේ.

05. එසේම, වෙබ් පිටුවට අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීම පිණිස, අදාළ තොරතුරු කලින්ම එක්රැස් කොට සකස් කර තබා ගැනීම අවශ්‍ය වේ. මේ සම්බන්ධව හැකි සෑම තොරතුරක්ම ග්‍රහණය කරගැනීමට හැකිවන අයුරින් ආකෘතියක් සකස් කර ඇති අතර, එම ආකෘතියේ පිටපතක් ඇමුණුම I ලෙස මෙයට අමුණා ඇත.

06. ඒ අනුව, අදාළ වෙබ් පිටුවේ තොරතුරු ඇතුළත් කිරීමට හැකිවනු පිණිස අදාළ සියලුම තොරතුරු ඇමුණුම පරිදි 2018 ජුනි 25 දිනට හෝ ඊට ප්‍රථම එක්රැස් කර සකස් කොට තබාගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම කාර්යය සම්පූර්ණ වනතෙක් මෙම අමාත්‍යාංශය විසින් වරින්වර ඔබ වෙත උපදෙස් ලබාදෙනු ඇත.

මේ සඳහා ඔබ විසින් දක්වනු ලබන සහාය ඉතා අගය කොට සළකමි.

මෙයට - විශ්වාසී,

**අත්.කළේ / ඒ.ආර්.දේශප්‍රිය**
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත්:
1. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම:..........................................................................

## වත්මන් සංවර්ධන තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

(අ) සම්පූර්ණ කරනලද ව්‍යාපෘතිවල තොරතුරු

| 1 | 2 | 3 | 4 | 5 | | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියට අදාළ රේඛීය අමාත්‍යාංශය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය(ග්‍රාම නිලධාරී කොට්ඨාසය) | ව්‍යාපෘති කාල සීමාව (ක්‍රියාත්මක කරනු ලබන හා සම්පූර්ණ කරනු ලබන දින) | | ප්‍රධාන කාර්යයන් | මුළු ඇස්තමේන්තුව (රු. මිලියන) | | | | |
| | | | | සිට | දක්වා | | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන) | දේශීය අරමුදල් | විදේශීය අරමුදල් | ව්‍යාපෘතියේ සත්‍ය වියදම (රු.මිලියන) | ව්‍යාපෘතියට ආධාරලබා දෙන අය |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

| 1 | 2 | 3 | 4 | 5 | | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියට අදාළ රේඛීය අමාත්‍යාංශය | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය(ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ ප්‍රදාන අරමුණු | ව්‍යාපෘති කාල සීමාව (ක්‍රියාත්මක කරනු ලබන හා සම්පූර්ණ කරනු ලබන දින) | | ප්‍රධාන කාර්යයන් | මුළු ඇස්තමේන්තුව (රු. මිලියන) | | | | 2018 අයවැය ප්‍රතිපාදන (රු. මිලියන) | 2018 මැයි අවසානය වන විට සමුච්චිත වියදම (රු.මිලියන) |
| | | | | සිට | දක්වා | | සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන) | දේශීය අරමුදල් | විදේශීය අරමුදල් | ව්‍යාපෘතියට ආධාරලබා දෙන අය | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

(නව යෝජිත ව්‍යාපෘතීන්

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතිය පිහිටි ස්ථානය(ග්‍රාම නිලධාරී කොට්ඨාසය) | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු | ප්‍රධාන කාර්යයන් | පිරිවැය ඇස්තමේන්තුව |
| | | | | |
| | | | | |